# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

பொலிஸ் ஊடகப் பிரிவு

POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| දිනය Date | 2025.01.31 පැය 1610 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 184/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |
|---|---|---|---|---|---|---|---|


## 1997 කෙටි දුරකථනය ඔස්සේ මහජනතාවගෙන් තොරතුරු ලබා ගැනීම - පොලිස් මූලස්ථානය.

මහජනතාව විසින් පොලිසිය වෙත අපරාධකරුවන් පිළිබඳ තොරතුරු, මත්ද්‍රව්‍ය ජාවාරම් පිළිබඳ තොරතුරු සහ අනෙකුත් නීති විරෝධී ක්‍රියා සිදු කිරීම් පිළිබඳ තොරතුරු ලබා දුන් පසු එම තොරතුරු ලබා දුන් පුද්ගලයින් පිළිබඳ විස්තර නැවත වතාවක් අපරාධකරුවන් සහ නීති විරෝධී ක්‍රියාවන් සිදුකරන්නන් වෙත ලැබෙන බවට මහජනතාව තුළ සැකයක් පවතී. මෙම සැකය දුරු කර මහජනතාව සහ පොලිසිය අතර විශ්වාසය ඇති කර ගත යුතුව ඇත. ඒ අනුව තොරතුරු ලබා දෙන්නාට තමන්ගේ අනන්‍යතාවය ප්‍රකාශ කිරීමකින් තොරව පොලිසිය වෙත තොරතුරු ලබා දීම සඳහා "1997" කෙටි දුරකථන අංකය හඳුන්වාදී ඇත.

මෙහි ප්‍රධාන මෙහෙයුම් මැදිරිය පොලිස් මූලස්ථානයට අනුයුක්තව කොළඹ 07 මළලසේකර මාවතේ පිහිටි විශේෂ කාර්යංශ මූලස්ථානයේ ස්ථාපිත කර ඇත. මෙම දුරකථන අංකයට ලැබෙන තොරතුරු පිළිබඳව පූර්ණ රහස්‍යභාවය ආරක්ෂා කිරීමට කටයුතු කරන ලෙසට වැඩබලන පොලිස්පතිතුමා විසින් සියළුම නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.

**මෙම කෙටි දුරකථන අංකය මඟින් පහත සඳහන් කරුණු වලට අදාල තොරතුරු පොලිසිය වෙත දැනුම් දිය හැක.**

- විෂ මත්ද්‍රව්‍ය, අපරාධ, මහා පරිමාණ දූෂණ ක්‍රියා, ජාතික ආරක්ෂාවට තර්ජනයක් විය හැකි ක්‍රියා
- රජයේ වාහන හා දේපල අවභාවිතා කිරීම, සැඟවීම හෝ පැහැර ගැනීම සම්බන්ධව තොරතුරු,
- විදේශ සංචාරකයින්ට සිදු වන හිරිහැර, කරදර හෝ ආරක්ෂාවට බලපාන කරුණු සම්බන්ධව.
- විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන තුල ක්‍රියාත්මක නවක වදය සම්බන්ධ තොරතුරු.
- පොලිස් නිලධාරීන් විසින් සිදු කරනු ලබන වංචා, අල්ලස් ලබා ගැනීම වැනි අකටයුතුකම් සම්බන්ධව
- පරිසර වැරදි පිළිබඳ තොරතුරු.
- වෙනත් වැදගත් තොරතුරු
-

**එමෙන්ම උතුරු නැගෙනහිර ප්‍රදේශ වල සිටින මහජනතාවට දමිළ බසින් ඉහත කරුණු සම්බන්ධයෙන් "107" කෙටි දුරකථන අංකය ඔස්සේ තොරතුරු ලබා දීමේ හැකියාව පවතියි.**

"1997" හා "107" යන කෙටි දුරකථන අංක මඟින් ඉහත සඳහන් කරුණු සම්බන්ධව තොරතුරු ලබා දිය හැකි බවට පොලිසිය මහජනතාව දැනුවත් කර සිටී.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**